මගේ අංකය : JSC/SEC/CIR-L/2024

**සියලුම විනිශ්චයකාරවරුන් වෙත,**

<u>කාන්තා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ කටයුතු ආරම්භ කිරීම</u>

ශීර්ෂගත කරුණට අදාළව පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්, ඩී. ඩී. යූ. කේ. හෙට්ටිආරච්චි මහතා විසින් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් අමතා ඇති 2024.08.23 දිනැති ලිපිය හා සබැඳිව විනිශ්චයකාරවරුන් දැනුවත් කරන ලෙසට ඉල්ලා සිටිමින් අධිකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, පියුමන්ති පීරිස් මහත්මිය විසින් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇති 2024.09.02 දිනැති ලිපිය පිළිබඳව සලකා බැලූ එම සේවා කොමිෂන් සභාව, ඩී. ඩී. යූ. කේ. හෙට්ටිආරච්චි මහතා විසින් යොමු කර ඇති 2024.08.23 දිනැති ලිපිය අධිකරණ සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පළ කොට සියලුම විනිශ්චයකාරවරුන්ගේ අවධානයට ලක් කරන ලෙසට මට නියම කර ඇත. ඒ අනුව එම ලිපි මේ සමඟ අමුණා ඔබගේ අවධානයට ලක් කරමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. එස්. සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2024 සැප්තැම්බර් මස 10 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

ලේකම් / செயலாளர் / Secretary
දුරකථනය / தொலைபேசி / Telephone 2449959
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2445447
E-Mail: secretary@moj.gov.lk

ප්‍රධාන කාර්යාලය / பொது அலுவலகம் / General Office
දුරකථනය / தொலைபேசி / Telephone 2323022
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2320785
Web Site: www.moj.gov.lk

**අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය**
**நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும்அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு**
**Ministry of Justice, Prison Affairs and Constitutional Reforms**

තැ.පෙ. / தபால்பெட்டி / P.O. Box. 555
ඉලෙක්ට්‍රොනික තැපැල / மின்அஞ்சல் / E-mail info@moj.gov.lk
නො 19, ශ්‍රී සංඝරාජ මාවත කොළඹ 10
இல19, ஸ்ரீசங்கராஜ மாவத்த கொழும்பு 10
No 19, Sri Sangaraja Mw Colombo 10

මගේ අංකය / எனதுஇல / My No. MOJ/L8/05/01
ඔබේ අංකය / உமது. இல. / Your No.
දිනය / திகதி / Date 2024.09. 2

04 SEP 2024

ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ -12.

**<u>කාන්තා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ කටයුතු ආරම්භ කිරීම</u>**

උක්ත කරුණට අදාළව පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් විසින් එවන ලද අංක පුනකා/ප්‍ර/01/01/2024 (85) හා 2024.08.23 දිනැති ලිපිය හා බැඳේ. (අදාළ ලිපියේ පිටපතක් අමුණා ඇත.)

02. එකී ලිපියේ සඳහන් කර ඇති පරිදි ප්‍රථම අදියර වශයෙන් කාන්තා රැඳවියන් 100 දෙනෙකු සඳහා වව්නියාව සාරංගා මධ්‍යස්ථානයේ පුනරුත්ථාපන පහසුකම් ඇතුළු මූලික අවශ්‍යතා සූදානම් කර ඇති බවත් දන්වා ඇති අතර ඒ සම්බන්ධව විනිසුරුවරුන් දැනුවත් කරන්නේ නම් මැනවි.

පියුමන්ති පීරිස්
අතිරේක ලේකම් (නීති)
ලේකම් වෙනුවට
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
පිටපත්:-

1. අධ්‍යක්ෂ
   ශ්‍රී ලංකා විනිසුරුවරුන් පුහුණු කිරීමේ ආයතනය, අධිකරණ මාවත, කොළඹ 12. - මේ පිළිබඳව ගරු මහේස්ත්‍රාත්වරුන් දැනුවත් කර අවශ්‍ය ඉදිරි කටයුතු ගැනීම සඳහා
2. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
   බන්ධනාගාර මූලස්ථානය - පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් විසින් එවන ලද ලිපිය සම්බන්ධව කරු. දැ.ගැ.ස.
3. පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් - ඔබගේ පුනකා/ප්‍ර/01/01/2024 (85) හා 2024.08.23 දිනැති ලිපිය සම්බන්ධව කරු. දැනගැනීම සඳහා

B7926


පුනරුත්ථාපන කාර්යාංශය
புனர்வாழ்வுப் பணியகம்
**BUREAU OF REHABILITATION**
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு
**MINISTRY OF JUSTICE, PRISON AFFAIRS AND CONSTITUTIONAL REFORMS**

අංක: 462/2, කඩුවෙල පාර, ගනහේන, බත්තරමුල්ල.
இல: 462/2, கடுவெல வீதி, கனஹேன, பத்தரமுல்ல.
No: 462/2 ,Kaduwela Road, Ganahena , Battaramulla.


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No | පුනකා/ප්‍ර/01/01/2024 ( 85 ) | |
| ඔබේ අංකය / உமது இல / Your No | | |
| දිනය / திகதி / Date | 2024.08. 23 | |

ලේකම්,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.

ලේකම් තුමණි,

**කාන්තා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ කටයුතු ආරම්භ කිරීම.**

යොමුව:
- අ. පුනකා/ප්‍ර/01/01/2024(61) හා 2024.07.05 දිනැති මෙම කාර්යාංශ ලිපිය.
- ආ. MOJ/L8/05/01 හා 2024.07.22 දින අධිකරණ සේවා කොමිෂන් සභාව අමතන ලද ඔබ අමාත්‍යාංශ ලිපිය.

1. අන්තරායකර ඖෂධ වලට ඇබ්බැහිවූ කාන්තාවන් පුනරුත්ථාපන කිරීම සඳහා මෙම කාර්යාංශය යටතේ ස්ථාපිත වව්නියාව සාරංගා මධ්‍යස්ථානය වෙත එම කාන්තාවන් යොමු කිරීමට අවැසි ඉදිරි කටයුතු සිදු කර දෙන ලෙසට යොමුගත "අ" දරණ ලිපිය මගින් ඉල්ලීමක් කරන ලදී.

2. එම ඉල්ලීමට ප්‍රකාරව යොමුගත "ආ" දරන ලිපිය මගින් මේ සබැඳිව අධිකරණ සේවා කොමිෂන් සභාව දැනුවත් කොට ඇතත් මෙතෙක් ඒ සඳහා යහපත් ප්‍රතිචාර ලැබී නොමැති බැව් දන්වා සිටිමි.

3. මේ වන විට වව්නියාව සාරංගා මධ්‍යස්ථානයෙහි ප්‍රථම අධියර වශයෙන් කාන්තාවන් 100 දෙනෙකු පුනරුත්ථාපනය කල හැකි වන පරිදි යටිතල පහසුකම් ඇතුළු මූලික අවශ්‍යතා සූදානම් කර ඇති බැවින් අධිකරණ නියෝග යටතේ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූ කාන්තාවන් පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමට අවැසි දැනුවත් කිරීම් සිදු කොට ඉදිරි කටයුතු සිදු කර දෙන මෙන් නැවතත් කාරුණිකව ඉල්ලා සිටිමි.

Hettiawachchi

ඩී ඩී යූ කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී එම්ෆිල්
මේජර් ජෙනරල් (විශ්‍රාමික)
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්

පිටපත -
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් - බන්ධනාගාර මූලස්ථානය

RECD 26 AUG 2024

නීති අංශය 28 AUG 2024 අධිකරණ අමාත්‍යාංශය